ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 02/2009

මගේ අංකය : COM 2/TRANS/03/0015
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2009.06. 22 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2010

රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවාවන්හි සියලුම වාර්ෂික ස්ථාන මාරු 2010 ජනවාරි මස පළමු වෙනි දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කළයුතු අතර, එහිදී නිලධාරීන්ට මෙන්ම රාජ්‍ය සේවාවට ද ඇතිවන අපහසුතා මගහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සැලකිලිමත් විය යුතුය.

03. පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු කමිටු පිහිටුවීමට ක්‍රියා කළයුතුය.

**3.1 දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු - ස්ථානමාරු තීරණ 2009. 07.31 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.**

දෙපාර්තමේන්තු ඇතුළත සේවා ස්ථාන වලට කෙරෙන මාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම. (දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කෙරෙන ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කිරීම)

**3.2 අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු - ස්ථානමාරු තීරණ 2009.07.31 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය**

එක් අමාත්‍යාංශයක් යටතේ වන දෙපාර්තමේන්තු අතර, ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම

**3.3 ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු**

අමාත්‍යාංශ අතර හා දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

3.4 ස්ථාන මාරු සඳහා ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ ඒ සේවාවන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබේනම් අදාළ සේවාවන් සඳහා වෙන වෙනම මාරු කමිටු පිහිටුවිය යුතුය.

04. සෑම මාරු කමිටුවක් විසින් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයට යටත්ව මෙම චක්‍රලේඛයේ 5 වගන්තියේ සඳහන් පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කළ යුතු වන්නේය. මෙම චක්‍රලේඛය ප්‍රකාශයට පත් කිරීම මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන සම්පූර්ණ කළා සේ සැලකේ.

05. ස්ථාන මාරු සඳහා නිලධාරීන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණ ගැනීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගැනීම මැනවි.

5.1 2009 දෙසැම්බර් 31 දින වන විට :-

(අ) සේවාවේ වසර 03 සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක අවුරුදු 02 සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීහු ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබති.

(ආ) රජයේ ආයතනයක/ දෙපාර්තමේන්තුවක/ අමාත්‍යාංශයක/ අමාත්‍යාංශයක් යටතේ ඇති එකම කාර්යාලයක වසර 05 සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

(ඇ) සුනාමි ආපදා හේතුවෙන් 2005 වසරේ මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වූ ස්ථාන මාරුවීම් සඳහා වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කරන දිනය 2010 මාර්තු 01 දින වේ.

5.2 ප්‍රියමනාප සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද යම් නිලධාරියෙක් ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලබාදිය හැකිය.

5.3 5:1(අ) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 5.1(ආ) ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට මාරු කළ හැකිය.

5.4 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු එවැනිම වෙනත් කාර්යාලයකට මාරු නොකළ යුතුය. මෝටර් රථ ප්‍රවාහන/ ආගමන හා විගමන/ රේගු/ විදේශ කටයුතු/ දේශීය ආදායම්/ විභාග/ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව/ රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ සුරාබදු දෙපාර්තමේන්තුව/විශේෂ කාර්ය බලකා මූලස්ථානය ප්‍රියමනාප දෙපාර්තමේන්තු හා ආයතන ලෙස සළකනු ලැබේ. විදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය සම්බන්ධයෙන් ප්‍රිය මනාප සේවා ස්ථානයක් සේ සලකනු නොලැබේ.

5.5 (අ) සේවා කාලය ගණනය කිරීමේදී දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

(ආ) කිසියම් දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ /අමාත්‍යාංශයේ සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

5.6 (අ) ප්‍රියමනාප සේවා ස්ථානවල ගත කළ සේවා කාලය ගණනය කිරීමේදී පූර්වාසන්න වසර 15 තුළ සේවය කළ (එම කාල පරිච්ඡේදවල ප්‍රියමනාප යැයි හඳුන්වනු ලැබූ) ප්‍රියමනාප සේවා ස්ථාන කිහිපයක වුවද එම කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

(ආ) සේවාවන් එකකට වැඩි ගණනක සේවය කළ නිලධාරීන්ගේ ප්‍රියමනාප සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයකදී එම සේවයට ප්‍රියමනාප වූ දෙපාර්තමේන්තුවක සේවය කර ඇත්නම් එයද ගණන් ගනු ලැබේ.

(ඇ) දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී නිලධාරියකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

5.7 භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම් අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට මාරු කම්වු සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

5.8 නිලධාරියාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු මිස නැත්නම් සාමාන්‍ය වශයෙන් වයස අවු. 53ක් ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම්වලට යටත් වන්නේය.

5.9 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.10 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීනව අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන්, වැනි නිලධාරීන්ට මුහුණ දීමට සිදුවන විසඳගත නොහැකි ගැටළුවලදී පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් ද සමග ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

5.11 (අ) ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරුවීම් ප්‍රතිපත්තියට පටහැනිය.

(ආ) මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

(ඇ) වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති 214, 217 වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

5.12 දරුවන් පාසලට යැවීමේ කටයුතුවලට අවහිරයක් නොවනු පිණිස හැකිතාක් දුරට සෑම මාරු කිරීමක්ම ක්‍රියාත්මක විය යුත්තේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස 01 වෙනි දින සිටය.

5.13 ප්‍රියමනාප නොවන්නා වූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන් ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරාගැනීමට සැළකිලිමත් විය යුතුය.

5.14 ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගත් ප්‍රස්තුත සේවයේ වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති / ලේකම් / භාණ්ඩාගාරික / හා මධ්‍ය විධායක මණ්ඩලයේ සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැළකිල්ලට ගතයුතු වේ. මෙම ස්ථාන මාරු කිරීම්, කාර්ය පටිපාටියේදී වෘත්තීය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ එක් සේවාවක් පමණක් නියෝජනය කරනු ලබන වෘත්තීය සමිති වේ. මෙම අනුග්‍රහය ලබාගැනීමට අපේක්ෂා කරන සියලුම වෘත්තීය සමිති තම වෘත්තීය සමිති නිලධාරීන් පිළිබඳ විස්තර ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:5 වගන්තියේ ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරුවීම් කම්වු කටයුතු කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

5.15 යම් නිලධාරියකු හෝ නිලධාරිණියකගේ කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රියාන්විත සේවයේ නියුතු වන විට ඔවුන් මාරු කළ යුත්තේ එම නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව පමණි. තවද එවැනි ක්‍රියාන්විත සේවයේ නියුතු අයගේ කලත්‍රයන් විසින් ස්ථාන මාරු සඳහා කරනු ලබන ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය දියයුතු වේ. මෙවැනි නිලධාරීන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධාරියාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරුකළ යුතුය.

5.16 ප්‍රියමනාප ස්ථානවල සේවය කරන නිලධාරින් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

5.17 ස්ථාන මාරු සඳහා එවනු ලබන ඉල්ලුම්පත්‍ර මෙම චක්‍රලේඛයෙහි නියමිත ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. නියමිත ඉල්ලුම් පත්‍රය මෙයට අමුණා ඇති අංක 01 'අ' , 'ආ' , 'ඇ' දරන ආකෘති පත්‍රය අනුව සකස් කරගත් ඉල්ලුම්පත්‍රවල ඉදිරිපත් කළ යුතුය. (දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මාරු කමිටු විසින් ද සුදුසු සංශෝධන සහිතව මෙම ආකෘති පත්‍රය පාවිච්චි කිරීම මැනවි)

06. ඉහත 3:1 ඡේදයට අදාළව දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු හා 3:2 ඡේදය යටතේ අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු තීරණයන්ට එළඹීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටුවලට තීරණ ගැනීමට හැකිවන පරිදි මෙම චක්‍රලේඛයේ 12 ඡේදයේ සඳහන් කර ඇති දින නොඉක්මවමින් අංක 01 'අ' , 'ආ' සහ 'ඇ' ආකෘති හා උපලේඛනගත කරන ලද 02 හා 03 ආකෘතිද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට කටයුතු කළ යුතුය. තවද එක් නිලධාරියෙකුට එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දිය යුතුය.

(අ) මෙම අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරුවීම් ලැයිස්තු පිළියෙල කරන අවස්ථාවේදී හා සම්පූර්ණ කළ පසුවද සමහර අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් සිදුකරන හෙයින් වාර්ෂික ස්ථාන මාරුවීම් කිරීමේදී ව්‍යාකූලත්වයක් වාර්තා වී ඇත. එබැවින් මෙම තත්ත්වය මගහැරවීම සඳහා දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ ස්ථාන මාරුවීම් 12.1 ඡේදය යටතේ දක්වා ඇති කාලවකවානුවලට අනුකූලව පවත්වා ඒවායේ තීරණ 2009 ජූලි 31 ට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එවිය යුතුය. ඉන්පසු ඔවුන් විසින් කිසිදු ස්ථාන මාරු තීරණයක් නොගත යුතුය.

(ආ) අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර මාරු කමිටු තීරණ නියමිත දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් නොකළහොත් එම ස්ථාන මාරුවීම් නොකලා සේ සළකා ක්‍රියා කරනු ලැබේ.

07. ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් / අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

08. මෙම අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ පිහිටුවා ඇති ස්ථාන මාරු කමිටු වෙත පහත සඳහන් ලියකියවිලි 12 වන ඡේදයේ සඳහන් කාල සටහනට අනුකූලව ජූලි මස 31 දිනට පෙර ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන් / ආයතන ප්‍රධානීන් ක්‍රියා කළයුතුය.

8.1 (අ) මේ සමග ඇමුණුම් අංක 01 'අ' , 'ආ' සහ 'ඇ' ආකෘතියට අනුව සකස් කරන ලද අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් ඉල්ලුම්පත්,

හා

(ආ) ඉහත පරිදි ලැබී ඇති සියලුම ස්ථාන මාරු ඉල්ලුම්පත් මේ සමග ඇති ඇමුණුම් අංක 02 දරන ආකෘතියට අනුව උපලේඛන

8.2 එකම ආයතනයක/ දිස්ත්‍රික්කයක අවුරුදු 05කට වඩා සේවය කර ඇති ඒකාබද්ධ සේවයේ සියලු නිලධාරීන්ගේ සේවා විස්තර ඇතුළත් මෙහි අමුණා ඇති අංක 03 උපලේඛනය

8.3 ඉහත අංක 06 ඡේදයේ (ආ) යටතේ කරන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ස්ථාන මාරු නියෝග පිළිබඳ වාර්තාවද මේ සමග එවිය යුතුය.

9 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ XVIII පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 210 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කළයුතුය. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බලනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අතිවිශේෂ ගැසට් පත්‍රයේ XVIII පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 211 වගන්තියට අනුකූල වේ නම් පමණි.

10. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා
- නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධාරීන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව

11. **2009 ජූලි මාසයේ 01** දිනයත්, **2009 දෙසැම්බර් මාසයේ 31** වන දිනයත් අතර කාලයේදී අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාරනොගත යුතුය.

12. ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් සම්බන්ධව ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කාල සටහන් අනුගමනය කළ යුතුය.

12.1 මෙම චක්‍රලේඛයේ 3.1 හා 3.2 යටතේ ස්ථාන මාරු පිළිබඳව කටයුතු කිරීම සඳහා කාල සටහන:-

| | |
|---|---|
| ජූනි 15 ට පෙර | - මාරු කමිටු පිහිටුවීම හා ස්ථාන මාරු පටිපාටිය සකස් කිරීම |
| ජූලි 01 ට පෙර | - ඉහත 3.1, 3.2 ඡේදය අනුව සියලුම ස්ථාන මාරු ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය. |
| ජූලි 15 ට පෙර | - 3.1, 3.2 ඡේදය අනුව දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ තීරණ ගෙන අවසන් කිරීම. |
| ජූලි 31 ට පෙර | - 3.1, 3.2 ඡේද අනුව දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ ස්ථාන මාරු තීරණ සහිත ලේඛන සකස් කිරීම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම. |

12.2 ඉහත 3.3 යටතේ ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු කාල සටහන:-

| | |
|---|---|
| ජූනි 01 ට පෙර | - මාරු කමිටු පිහිටුවීම. |
| ජූනි 15 ට පෙර | - ස්ථාන මාරු පටිපාටිය සකස් කර ගැනීම. |
| ජූනි 30 ට පෙර | - වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| අගෝස්තු 10 ට පෙර | - අංක 01 ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අංක 02, හා 03 ආකෘතිය අනුව උපලේඛනගත කළ අයදුම්පත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම. |
| අගෝස්තු 31 ට පෙර | - ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම. |
| සැප්තැම්බර් 15 ට පෙර | - ස්ථාන මාරු තීරණ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලට දැන්වීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. |
| සැප්තැම්බර් 29 ට පෙර | - ස්ථාන මාරුවීම් පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය. |
| ඔක්තෝබර් 15 ට පෙර | - එම අභියාචනා පිළිබඳ තීරණ ගැනීම. |
| නොවැම්බර් 01 ට පෙර | - අභියාචනා පිළිබඳ තීරණ දැනුම් දීම අවසන් කිරීම. |

13. සෑම නිලධාරියෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලට ද යටත් වේ.

14. මාරු කමිටු මගින් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය.

15. ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි කටයුතුවලට වාර්තා කර තිබියදීත් ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ නිලධාරීන් මුදාහැර නොමැති අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

16. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධාරීහු, නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

17. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත දැන ගැනීමට සලස්වන්න.

18. මෙම ස්ථාන මාරු කමිටුවලදී තීරණ ගැනීමේදී මාරුවී යන සහ මාරුවී එන නිලධාරීන් දරන තනතුරුවල රාජකාරිවලට බාධාවක් නොවන පරිදි ක්‍රියා කළ යුතුය.

19. **ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි 11 වගන්තියේ** විධිවිධාන අදාළ විය යුතුය.

**බී.පී.පී.එස්.අබේගුණරත්න,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

(වාර්ෂික ස්ථාන මාරු අංක 01 'අ' ආකෘතිය)

**ඉතා වැදගත්**

> වාර්ෂික ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන් පමණක් මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.වර්තමාන සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ වීම මත මෙම ආකෘතිය සම්පූර්ණ කිරීම නොකල යුතුය.

## ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීමක් සඳහා ඉල්ලුම්පත
## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය

01. දැනට සේවය කරන
   - i. අමාත්‍යාංශය :-........................................................................................
   - ii. දෙපාර්තමේන්තුව:-........................................................................................
   - iii. කාර්යාලය:- ........................................................................................
   - iv. කාර්යාලය පිහිටි නගරය:-........................................................................................

02. 
   - i. නිලධාරියාගේ සම්පූර්ණ නම (පත්වීම් ලිපියේ සඳහන් පරිදි):- ...............................
     ........................................................................................
     ........................................................................................
   - ii. ජාතික හැඳුනුම්පත් අංකය:- ........................................................................ ........
   - iii. නිලධාරියාගේ ස්ථිර(පෞද්ගලික)ලිපිනය:- ........................................................................
     ........................................................................................
   - iv. නිලධාරියා දැනට පදිංචි ලිපිනය:- ........................................................................
     ........................................................................................
   - v. දැනට පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:-
     ........................................................................................

03. 
   - i. උපන්දිනය:-.

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

     වයස(2009.12.31 දිනට) :-

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

   - ii. ස්ත්‍රී/පුරුෂ භාවය:-........................................................

04 
   - i පත්වීම් ලිපියේ අංකය :-.......................
   - ii. කළමනාකාර සහකාර සේවයට ඇතුලත් වීමට පෙර සිටින ලද සේවය
   - iii. එම සේවයට පත්වූ වූ දිනය
   - iv. භාෂා මාධ්‍යය
   - v. දැනට සිටින පන්තිය නැතහොත් ශ්‍රේණිය
   - vi. එම පන්තියට නැතහොත් ශ්‍රේණියට ඇතුලත්වූ දිනය

| | | |
|---|---|---|
| ලිපිකරු/සරප්/ ග.භාරකාර/ පොත්තබන්නා/ ලඝු ලේඛක / යතුරු ලේඛක | | |
| | | |
| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| රා.ක.ස.සේ. III / II / I | | |
| | | |

(අනවශ්‍ය වචන කපාහරින්න.)

05.

i. නිලධාරියා /නිලධාරිණිය විවාහකද/අවිවාහකද යන වග :- ...............................

ii. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-.........................................................

iii. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගනුම ලබන පාසල් :-..............
.........................................................................................................

iv. කලත්‍රයාගේ නම සහ සේවා ස්ථානයක් වේ නම්, සේවය කරන
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-..................................................................
තනතුර :-...............................................................................................
නගරය :-...............................................................................................

v. කලත්‍රයා ස්ථාන මාරු සඳහා ඉල්ලීමක් කර තිබේ නම් ඒ කුමන අමාත්‍යාංශයකටද ?
දෙපාර්තමේන්තුවකටද ?

vi. තම කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ
නියුතු ද ? එසේ නම් ඔහු හෝ ඇය අයත්වන සේවාව හා තනතුර:-
(ක්‍රියාන්විත සේවයේ නිරත වීම සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් අමුණන්න)

06. (අ.) සේවයට ඇතුළත්වූ දවසේ සිට (කණිෂ්ඨ සේවක හා අනියම් හා තාවකාලික සේවා කාලයද ඇතුළුව) මේ දක්වා සේවා විස්තර :-

(මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන ඉතා වැදගත් වන බව අවධාරණය කෙරේ. මෙහි ඉඩ ප්‍රමාණවත් නොවේ නම් මෙයට අනුරූප ඇමුණුමක් ඇතුළත් කරන්න)

| සිට | දක්වා | මුළු කාලය | කාර්ය ස්ථානය(නගරය සඳහන් කරන්න) | දෙපාර්තමේන්තුව | කවර අමාත්‍යාංශය යටතේද ? |
|---|---|---|---|---|---|
| | | | | | |

(ආ) වෙනත් සේවයක යෙදී සිටියදී ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය ..............
කළමනාකරණ සහකාර සේවය යටතේ ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය............

(අසම්පූර්ණ, සාවද්‍ය තොරතුරු සැපයීම දඬුවම් ලැබිය යුතු වරදක් බව සලකන්න)

(ඇ) නිලධාරියා මාරුවීමට කැමති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු තුනක් කැමැත්ත අනුව පිළිවෙලින් සඳහන් කරන්න.

නිලධාරියා මාරුවීම අපේක්ෂා කරන දිස්ත්‍රික්කය හා සේවා ස්ථානය

| | සේවා ස්ථානය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |

07. ඉල්ලුම් කිරීමට හේතු :-

| |
|---|
| i. |
| ii. |
| iii. |

08. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :- ..................................................................................
.............................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :- නිලධාරියාගේ අත්සන

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත,

සුදුසු අනුප්‍රාප්තියකයෙකු සහිතව/ රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරනු ලැබේ/ නොලැබේ. අදාල චක්‍ර ලේඛයේ අංක 06,10,11,12, හා 13 ජේද යටතේ කටයුතු කිරීමට එකඟ වෙමි.
.

දිනය :-...................................... දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

(වාර්ෂික ස්ථාන මාරු අංක 01 'ආ' ආකෘතිය)

**ඉතා වැදගත්**

| |
|---|
| වාර්ෂික ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන් පමණක් මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.වර්තමාන සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ වීම මත මෙම ආකෘතිය සම්පූර්ණ කිරීම නොකළ යුතුය. |

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීමක් සඳහා ඉල්ලුම්පත**
**ඒකාබද්ධ රියදුරු සේවය / කාර්යාල සේවක සේවය**

01. දැනට සේවය කරන
   **i.** අමාත්‍යාංශය :-.................................................................................................
   **ii.** දෙපාර්තමේන්තුව:-..............................................................................
   **iii.** කාර්යාලය:- .......................................................
   **iv.** කාර්යාලය පිහිටි නගරය:-.................................................

02. i. නිලධාරියාගේ සම්පූර්ණ නම (පත්වීම් ලිපියේ සඳහන් පරිදි):- ............
.........................................................................................................................
.......................................................................................

ii. ජාතික හැඳුනුම්පත් අංකය:- ....................................................................... ........

iii. නිලධාරියාගේ ස්ථිර(පෞද්ගලික)ලිපිනය:- ...............................................
.........................................................................................................

iv. නිලධාරියා දැනට පදිංචි ලිපිනය:- ..........................................................
.........................................................................................................

v. දැනට පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:-
.....................................................................................................

03. i. උපන්දිනය:-.

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

වයස(2009.12.31 දිනට) :-

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

iii. ස්ත්‍රී/පුරුෂ භාවය:-..........................................................

04. i ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත්කළ පත්වීම්/අන්තර්ග්‍රහණ ලිපියේ අංකය:- ............................

| | |
|---|---|
| ii. රියදුරු/කා.කා.සේ සේවයට ඇතුළත් වූ දිනය | |
| iii. දැනට සිටින පන්තිය නැතහොත් ශ්‍රේණිය | රියදුරු II'ආ'/ II'අ' / I<br>කා.සේ.සේ. III / II / I<br>(කා.සේ.සේ. තනතුර:-..........) |
| iv. එම පන්තියට නැතහොත් ශ්‍රේණියට ඇතුළත්වූ දිනය | |

(අනවශ්‍ය වචන කපාහරින්න.)

05.

i නිලධාරියා/නිලධාරිණිය විවාහකද/අවිවාහකද යන වග:-.........................

ii දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-...........................................................

iii පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගනුම ලබන පාසල් :-..............
..................................................................................................................

iv කලත්‍රයාගේ නම සහ සේවා ස්ථානයක් වේ නම්, සේවය කරන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-...................................................................

තනතුර :-...................................................................................................

නගරය :-...................................................................................................

v කලත්‍රයා ස්ථාන මාරු සඳහා ඉල්ලීමක් කර තිබේ නම් ඒ කුමන අමාත්‍යාංශයකටද ? දෙපාර්තමේන්තුවකටද ?

vi තම කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාත්විත සේවයේ නියුතු ද ? එසේ නම් ඔහු හෝ ඇය අයත්වන සේවාව හා තනතුර:-
(ක්‍රියාත්විත සේවයේ නිරත වීම සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් අමුණන්න)

06 (අ) සේවයට ඇතුළත්වූ දවසේ සිට (කණිෂ්ඨ සේවක හා අනියම් හා තාවකාලික සේවා කාලයද ඇතුළුව) මේ දක්වා සේවා විස්තර :-

(මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන ඉතා වැදගත් වන බව අවධාරණය කෙරේ. මෙහි ඉඩ ප්‍රමාණවත් නොවේ නම් මෙයට අනුරූප ඇමුණුමක් ඇතුළත් කරන්න)

| සිට | දක්වා | මුළු කාලය | කාර්ය ස්ථානය(නගරය සඳහන් කරන්න) | දෙපාර්තමේන්තුව | කවර අමාත්‍යාංශය යටතේද ? |
|---|---|---|---|---|---|
| | | | | | |

(ආ) වෙනත් සේවයක යෙදී සිටියදී ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය ...............
රියදුරු/කා.කා.ස සේවය යටතේ ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය...........

(අසම්පූර්ණ, සාවද්‍ය තොරතුරු සැපයීම දඬුවම් ලැබිය යුතු වරදක් බව සලකන්න)

(ඇ) නිලධාරියා මාරුවීමට කැමති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු තුනක් කැමැත්ත අනුව පිළිවෙලින් සඳහන් කරන්න.

නිලධාරියා මාරුවීම අපේක්ෂා කරන දිස්ත්‍රික්කය හා සේවා ස්ථානය

| | සේවා ස්ථානය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|
| i.<br>ii.<br>iii. | | |

07. ඉල්ලුම් කිරීමට හේතු :-

| |
|---|
| i.<br>ii.<br>iii. |

08. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :- ........................................................................
..................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :- නිලධාරියාගේ අත්සන

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත,

සුදුසු අනුප්‍රාප්තියකයෙකු සහිතව/ රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරනු ලැබේ/ නොලැබේ. අදාළ චක්‍රලේඛයේ අංක 06,10,11,12,හා 13 ජේද යටතේ කටයුතු කිරීමට එකඟ වෙමි.

දිනය :-.................................... දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

(වාර්ෂික ස්ථාන මාරු අංක 01 'ඇ' ආකෘතිය)

**ඉතා වැදගත්**

| |
|---|
| වාර්ෂික ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන් පමණක් මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.වර්තමාන සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ වීම මත මෙම ආකෘතිය සම්පූර්ණ කිරීම නොකළ යුතුය. |

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීමක් සඳහා ඉල්ලුම්පත**
**පුස්තකාලයාධිපති සේවය**

01. දැනට සේවය කරන
 i. අමාත්‍යාංශය :-....................................................................................
 ii. දෙපාර්තමේන්තුව:-.......................................................................
 iii. කාර්යාලය:- .........................................................
 iv. කාර්යාලය පිහිටි නගරය:-..................................................

02. i. නිලධාරියාගේ සම්පූර්ණ නම (පත්වීම් ලිපියේ සඳහන් පරිදි):- ............
..................................................................................................................................
..........................................................................................

ii. **ජාතික හැඳුනුම්පත් අංකය:-** ........................................................................ ........

iii. නිලධාරියාගේ ස්ථිර(පෞද්ගලික)ලිපිනය:- ...............................................
.........................................................................................................

iv. නිලධාරියා දැනට පදිංචි ලිපිනය:- ..........................................................
.........................................................................................................

v. දැනට පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:-
.....................................................................................................

03. i. උපන්දිනය:-.

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

වයස (2009.12.31 දිනට) :-

| අ: | මා: | දි: |
|---|---|---|
| | | |

ii. ස්ත්‍රී/පුරුෂ භාවය:-.........................................................

04. i **පත්වීම් ලිපියේ අංකය :-** ................................

ii. පුස්තකාලයාධිපති සේවයට පත්වූ දිනය

iii. දැනට සිටින පන්තිය නැතහොත් ශ්‍රේණිය

iv. එම පන්තියට නැතහොත් ශ්‍රේණියට ඇතුළත්වූ දිනය

| |
|---|
| |
| පුස්තකාලයාධිපති සේවයේ III / II / I |
| |

(අනවශ්‍ය වචන කපාහරින්න.)

05. i. නිලධාරියා /නිලධාරිනිය විවාහකද/අවිවාහකද යන වග :- ...............................

ii දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-.........................................................

iii පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගනුම ලබන පාසල් :-..............
.................................................................................................................

iv කලත්‍රයාගේ නම සහ සේවා ස්ථානයක් වේ නම්, සේවය කරන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-...................................................................

තනතුර :-.....................................................................................................

නගරය :-.....................................................................................................

v කලත්‍රයා ස්ථාන මාරු සඳහා ඉල්ලීමක් කර තිබේ නම් ඒ කුමන අමාත්‍යාංශයකටද ? දෙපාර්තමේන්තුවකටද ?

vi තම කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතු ද ? එසේ නම් ඔහු හෝ ඇය අයත්වන සේවාව හා තනතුර:-
(ක්‍රියාන්විත සේවයේ නිරත වීම සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් අමුණන්න)

06. (අ) සේවයට ඇතුළත්වූ දවසේ සිට (කණිෂ්ඨ සේවක හා අනියම් හා තාවකාලික සේවා කාලයද ඇතුළුව) මේ දක්වා සේවා විස්තර :-

(මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන ඉතා වැදගත් වන බව අවධාරණය කෙරේ. මෙහි ඉඩ ප්‍රමාණවත් නොවේ නම් මෙයට අනුරූප ඇමුණුමක් ඇතුළත් කරන්න)

| සිට | දක්වා | මුළු කාලය | කාර්ය ස්ථානය(නගරය සඳහන් කරන්න) | දෙපාර්තමේන්තුව | කවර අමාත්‍යාංශය යටතේද ? |
|---|---|---|---|---|---|
| | | | | | |

(ආ) වෙනත් සේවයක යෙදී සිටියදී ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය ...............
පුස්තකාලයාධිපති සේවය යටතේ ප්‍රියමනාප සේවා ස්ථානයක/ස්ථානවල සේවා කාලය............

(අසම්පූර්ණ, සාවද්‍ය තොරතුරු සැපයීම දඬුවම් ලැබිය යුතු වරදක් බව සලකන්න)

(ඇ) නිලධාරියා මාරුවීමට කැමති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු තුනක් කැමැත්ත අනුව පිළිවෙලින් සඳහන් කරන්න.

නිලධාරියා මාරුවීම අපේක්ෂා කරන දිස්ත්‍රික්කය හා සේවා ස්ථානය

| | සේවා ස්ථානය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|
| i.<br><br>ii.<br><br>iii. | | |

07. ඉල්ලුම් කිරීමට හේතු :-

| |
|---|
| i.<br><br>ii.<br><br>iii. |

08. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :- ..........................................................................
..........................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :- නිලධාරියාගේ අත්සන

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත,

සුදුසු අනුප්‍රාප්තියකයෙකු සහිතව/ රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරනු ලැබේ/ නොලැබේ. අදාල චක්‍ර ලේඛයේ අංක 06,10,11,12,හා 13 ඡේද යටතේ කටයුතු කිරීමට එකඟ වෙමි.

දිනය :-.....................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

(වාර්ෂික ස්ථාන මාරු අංක 02 දරන ආකෘති පත්‍රය)
එක් එක් සේවාවන් හා පන්ති සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.

වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය -2010 වර්ෂය

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-.........................................................................................
ප්‍රාදේශීය කාර්යාලය :-.............................................

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම් පත් අංකය | තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2009.12.31 දිනට වයස හා ලිපිනය | විවාහක අවිවාහක බව- කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | කලත්‍රයා ආරක්ෂක සේවයේ ක්‍රියාත්මක රාජකාරියේ නියුතු අයෙක්ද? | සේවා ස්ථාන හා කාලසීමාව | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය | මාරු කමිටුවේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

සියළුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම :- අත්සන :-

පරීක්ෂා කළේ: නම :- අත්සන :-

දිනය :-

...................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

(වාර්ෂික ස්ථාන මාරු අංක 03 දරන ආකෘති පත්‍රය)
එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.

එක් දිස්ත්‍රික්කයක, එක් සේවා ස්ථානයක අවුරුදු 05කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න.(2009.12.31 දිනට)
වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-.......................................................................................................

ප්‍රාදේශීය කාර්යාලය :-.......................................................................................................

| නිලධාරියාගේ නම : මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම් පත් අංකය | තනතුර/ශ්‍රේණිය හා මාධ්‍යය | උපන් දිනය හා 2009.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2009.12.31 දිනට | විවාහක අවිවාහක බව-කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසල් යන ළමයින් පිළිබඳ විස්තර | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර තිබේද? අයදුම්කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

සකස් කළේ:- නම

අත්සන:-

(අ) මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ /කාර්යාලයේ අවුරුදු 05 ට වැඩි සේවා කාලයක් ඇති

(ආ) සියලුම නිලධාරීන් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව

සියළුම තොරතුරු නිවැරදි බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව සහතික කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් අදළ විනය නිලධාරියාට වාර්තා කිරීමට සිදුවිය හැකි බව සැළකිල්ලට ගනිමින් සහතික කරමි.

පරීක්ෂා කළේ:- නම අත්සන:-

දිනය:- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

සෑම නිලධාරියෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙලිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස්කළ හා හරිවැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලට ද යටත් වේ.

# වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය (ඒකාබද්ධ සේවය)

1. ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පහත දැක්වෙන ආකාරයෙන් සිදුකෙරේ.

(අ) මාරු කමිටු මගින් (වාර්ෂික ස්ථාන මාරු)

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටු ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධාරියෙකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබාගැනීම සඳහා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක/ ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමටද මාරු කමිටු තීරණ ගත හැක. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

(ආ) ඒකාබද්ධ සේවා අංශය මගින් (වාර්ෂික නොවන ස්ථාන මාරු)

වාර්ෂික මාරු කමිටුවලදී හැර ඒකාබද්ධ සේවා අංශයේ දෛනිකව සිදුකෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් සේවා අවශ්‍යතා, සහ විනය හේතු, මත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම් ද, නිලධාරීන්ගේ හදිසි වූද සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම් ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

2. දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු හා අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු

මාරු කමිටුවේ කාර්ය භාරය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව 206 හා 207 වගන්තිවලට අනුව කටයුතු කරමින් ඉහත 1(අ) ඡේදයේ සඳහන් අවස්ථාවලදී ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ ලබාදීම මාරු කමිටුවල කාර්ය භාරයයි.

3. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

3.1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාල ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (2010 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2009.12.31 දිනය)

3.2 සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයයි. නමුත් නිලධාරියාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

3.3 සේවා කාලය ගණනය කිරීමේදී එක් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව සේවය කල සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ. එසේම නිලධාරියකු ඒකාබද්ධ සේවයේම එක් තනතුරක සිට තවත් තනතුරකට පත්ව හෝ උසස්වීම් ලබා පැමිණි විටෙක එම සේවා දෙකෙහිම ගතකළ කාල පරිච්ඡේද මුළු සේවා කාලයක් ලෙස ගණන් ගත හැකි ය.

3.4 ප්‍රියමනාප සේවා ස්ථානවල ගතකළ සේවා කාලය ගණනය කිරීමේදී පූර්වාසන්න වසර 15 තුළ සේවය කළ (එම කාල පරිච්ඡේදවල ප්‍රියමනාප යයි හඳුන්වනු ලැබූ) ප්‍රියමනාප සේවා ස්ථාන කිහිපයක වුවද එම කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

3.5 කිසියම් දෙපාර්තමේන්තුවක්/ අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

3.6 සේවාවන් එකකට වැඩි ගණනක සේවය කළ නිලධාරීන්ගේ ප්‍රියමනාප සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයකදී එම සේවයට ප්‍රියමනාප වූ දෙපාර්තමේන්තුවක සේවය කර ඇත්නම් එය ද ගණන් ගනු ලැබේ. (උදා :- කණිෂ්ඨ සේවක උසස්වීම් ලද නිලධාරීන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය)

3.7 දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී නිලධාරියකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

3.8 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 සේවය කර තිබීම සහ නව පත්වීමක් ලැබූ නිලධාරියෙකු නම් මුල් සේවා ස්ථානයේ වසර 03ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවීමක් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් වේ.

3.9 වසර 05ට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වන්නේය.

3.10 අවුරුදු 53 ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

3.11 2010.01.01 දිනට අවු.58 ඉක්මවූ නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද මාරු නොකළ යුතුය. ප්‍රිය මනාප සේවා ස්ථානයන්හිදී මෙම විධිවිධාන අදාළ නොවේ.

3.12 ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගත් ප්‍රස්තුත සේවයේ වෘත්තීය සංගමයක මව් සංගමයේ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේ භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

3.13 මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්තිවිඳීමට අපේක්ෂා කරන ප්‍රස්තුත සේවයේ වෘත්තීය සංගම් වල නිලධාරීන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර ( ආයතන සංග්‍රහයේ XXV:7:5 උප වගන්තිය අනුව) මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල රැඳී සිටීමට මෙම අනුග්‍රහය අදාළ කර ගත නොහැක.

3.14 යම් නිලධාරියෙකුගේ/ නිලධාරිණියකගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු - නැගෙනහිර ක්‍රියාත්විත රාජකාරියේ නිරතව සිටින බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම් එවැනි නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධාරීන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධාරියාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරුකළ යුතුය.

3.15 සෑම විටම නිලධාරියාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබාදීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතු වේ.

3.16 පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයත් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් කළයුතු වේ.

3.17 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

3.18 මාරුවීම් අයදුම්කරන නිලධාරීන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රදේශයේ නම හා කාර්යාලයේ නම යන දෙකම සඳහන් කිරීම වරදක් නැත. තමන් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මතද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට වුවමනාවෙන් ද යන්න අයදුම්පතේ හැඟවීමක් කිරීම සුදුසුය. ඒ අනුව තමන්ගේ කැමැත්ත අනු පිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළයුතු වේ.

**3.19 නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල්දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.**

3.20 ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධාරියෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම දෙපාර්තමේන්තුව තුළ රඳවාගත යුතු යයි දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත ඉල්ලුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලිකර අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ඇතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තම ඉල්ලීම් ඉදිරිපත් කළයුතු වේ. අධ්‍යක්ෂ ජනරාල් විසින් මාරු කමිටුවලට ඒ පිළිබඳව දැනුම්දී ක්‍රියා කරනු ඇත. එක් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට සීමිත නිලධාරීන් පිරිසක් සඳහා පමණක් ඉල්ලීම් කළ හැක. එක් වතාවකදී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධාරියකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

3.21 මාරු කමිටු විසින් නිලධාරීන් මාරු කිරීමේදී දෙපාර්තමේන්තුවල සේවා අවශ්‍යතාවයන්ද කාර්යාලවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද හැම විටම උත්සාහ කළයුතු වේ. (උදා :- විභාග දෙපාර්තමේන්තුවට පිරිමි නිලධාරීන් වැඩි ප්‍රමාණයක් රඳවා තැබීම)

4. **සේවා ස්ථාන වර්ගීකරණය**

4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට්පත්‍රයේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ 203 වගන්තියෙහි (iii) අනු අංකයෙන් ආවරණය වන සේවා ස්ථාන හා (v) අනු අංකයෙන් ආවරණය වන සේවා ස්ථාන කිහිපයක් ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හැඳින්වේ.

4.2 ස්ථාන මාරුවී යාමට ඉල්ලීම් අඩු ප්‍රමාණයක් ඇති සේවා ස්ථාන ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වශයෙන් හැඳින්වේ.

4.3 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ ස්ථානවල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණකල නිලධාරීන් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරු නොකළ යුතුය.

4.4 ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල වසර 05ට වඩා සේවය කළ නිලධාරීන්ගේ නාම ලේඛනයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කළහොත් මාරුවී යාමට වඩාත් කැමති ස්ථාන 03 යනාදී සියලු තොරතුරු අදළ ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වනු ලබන දිනට පෙර එවීම අදළ අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම වන්නේය.

4.5 ඒ අනුව එම නිලධාරීන් අමාත්‍යාංශයෙන් පිටතට මාරුකර ඒ හා සමාන නිලධාරීන් සංඛ්‍යාවක් අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

4.6 සියලුම දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල වසර 05කට වැඩි කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන්ගේ වාර්තාවක් 4:4 උප වගන්තියේ දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවීමට දෙපාර්තමේන්තු ප්‍රධානින් හා අමාත්‍යාංශ ලේකම්වරු ඉතා වගකීමකින් යුතුව කටයුතු කළ යුතු වේ.

4.7 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධාරියෙකු ස්ථාන මාරුවීමක් ඉල්ලූවිට එම ඉල්ලීම ඉටු කිරීමට 4:4 හා 4:6 උප වගන්තිවල අවශ්‍යතා සපුරා ඇති එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට මාරු කළ හැකිය.

4.8 ප්‍රියමනාප ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලබාදීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කළ නිලධාරීන්ටය. එමෙන්ම සේවා කාලය හා නිලධාරීන් විසින් දැනුම් දී ඇත්තම් ඔවුන්ට ප්‍රායෝගිකව මුහුණ දීමට සිදුවන ප්‍රශ්න ද සළකා බලනු ලැබේ.

4.9 පහත සඳහන් සේවා ස්ථාන ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සලකනු ලැබේ.

01. රේගු දෙපාර්තමේන්තුව

02. දේශීය ආදයම් දෙපාර්තමේන්තුව

03. විභාග දෙපාර්තමේන්තුව

04. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

05. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

06. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව

07. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

08. සුරාබදු දෙපාර්තමේන්තුව

09. විදේශ කටයුතු අමාත්‍යාංශය (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට අදාල නොවේ.)

10. විශේෂ කාර්ය බලකා මූලස්ථානය

5. වාර්ෂික මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු අවස්ථා

5.1 පහත නම් දැක්වෙන ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් ස්ථාන මාරුවීම් නොකළ යුතුය.

(අ) ජනාධිපති ලේකම් කාර්යාලය

(ආ අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය

(ඇ) සභානායක ලේකම් කාර්යාලය

(ඈ) අමාත්‍ය මණ්ඩල කාර්යාලය

(ඉ) ආණ්ඩු පක්ෂයේ සංවිධායක ලේකම් කාර්යාලය

(ඊ) විපක්ෂ නායක ලේකම් කාර්යාලය

5.2 පහත දැක්වෙන දෙපාර්තමේන්තු සහ ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් මාරුවීම් කළ හැකි නමුත් එම දෙපාර්තමේන්තු / ආයතනවලට යොමු කරනු ලබන නිලධාරීන් පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියාගේ එකඟතාවයට යටත්ව මාරුවීම් ක්‍රියාත්මක කළ යුතුය.

(අ) මැතිවරණ දෙපාර්තමේන්තුව

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලය

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලය.

(ඈ) පොලිස් කොමිෂන් සභාවේ කාර්යාලය.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.